# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2349/22 - 2023 සැප්තැම්බර් මස 13 වැනි බදාදා - 2023.09.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ සහ 70ඇ වගන්ති සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී.වී. 115017 දරන සහ අංක 495, මිනුවන්ගොඩ පාර, බෝලවලාන, මීගමුව යන ස්ථානයේ පිහිටි උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන බෙනඩික්ට් XVI කැතලික් ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩියුකේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබාගැනීමෙන් පසු, සහ එකී බෙනඩික්ට් XVI කැතලික් ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩියුකේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් 2022 සැප්තැම්බර් මස 30 වැනි දින දරන සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද සංස්ථාගත කිරීමේ සහතිකය යටතේ බෙනඩික්ට් XVI කැතලික් ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩියුකේෂන් යනුවෙන් සංස්ථාගත කරන ලද බැවින්ද, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2020 නොවැම්බර් මස 09 වැනි දින අංක 2201/4 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ "බෙනඩික්ට් XVI කැතලික් ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩියුකේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්" යන වචන දැක්වෙන සෑම තැනකම ඒ වෙනුවට, "බෙනඩික්ට් XVI කැතලික් ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩියුකේෂන්" යන වචන ආදේශ කිරීමෙන් ඒ නියෝගය මෙයින් සංශෝධනය කරනු ලබන අතර ඉහත කී වගන්ති ප්‍රකාර මීන් පෙර කරනු ලැබ ඇති යම් නියමයක, දැන්වීමක, ගිවිසුමක, සන්නිවේදනයක හෝ වෙනත් ලේඛනයක "බෙනඩික්ට් XVI කැතලික් ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩියුකේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්" සම්බන්ධයෙන් ඇති සෑම සඳහනක්ම "බෙනඩික්ට් XVI කැතලික් ඉන්ටර්නැෂනල් ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩියුකේෂන්" සම්බන්ධයෙන් කරන ලද සඳහනක් ලෙස කියවා තේරුම් ගත යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

තව ද, මේ නියෝගය ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ දිනයට පෙරාතුව ම 2020 නොවැම්බර් මස 09 වැනි දින අංක 2201/4 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මගින් "බෙනඩික්ට් XVI කැතලික් ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩියුකේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත පැවරී ඇති යම් බලයක් ප්‍රකාරව, එකී "බෙනඩික්ට් XVI කැතලික් ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩියුකේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ක්‍රියාත්මක කරන ලද යම් බලයක්, හෝ කරන ලද යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් සියලු කාර්යය සඳහා, "බෙනඩික්ට් XVI කැතලික් ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ටර්නැෂනල් හයර් එඩියුකේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ක්‍රියාත්මක කරන ලද සේ සහ කරන ලද සේ සලකනු ලැබිය යුතු බවට ද මෙයින් නියම කරනු ලැබේ.

ආචාර්ය **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත** (පා.ම.),
අධ්‍යාපන අමාත්‍ය.

2023 සැප්තැම්බර් මස 08 වැනි දින,
කොළඹ දී ය.

EOG 09 - 0111

1A - PG 6485 — 286 (2023/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*